18 වන පිටෙන්

ඔහු ඉතා කඩිසර මෙහෙකරුවෙකි. සති අන්තවලදී ඔහු වෙන අයට වඩා මත්පැන් පානය කළ පුරුද්ද නිසා අපට ඔහු වඩාත් හොඳින් දැන ගත හැකි විය.

ඉතා උස තරුණයෙක් වූ ඔහු ගේ සම කළු ලෝහයක් මෙන් දිලිසුණේය. සුදු මිනිසකුගේ හිසකේ රටාව අනුගමනය කරමින් කොණ්ඩය පැත්තකට පීරා තිබුනි. අගට අමුනා තිබුනේ ලෝහමය පනාවකි. සුහද බවක් දැනවුවද ඒ සමගම අප පවුල හා කිසියම් දුරස්ත බවක් රඳවා ගන්නට ද ඔහු වෑයම් කළේය. කෙසේවුවත," අප දෙන විධාන යුහුසුළුව ඉටු කිරීමටද ඔහු පුරුදුව සිටියේය. දැන් නම් ඔහු අපට හොඳටම කැපී පෙනෙයි. ,ඇත්තටම මෙයා මිස්ලන්ග නායකයගෙ පුතාම වෙන්න ඇති., මම මටම කියා ගත්තෙමි. , ලේ වල වෙනස තමයි.......,

ඔහුගේ ජන්මය හා ඉදිරි අනාගතය පිළිබඳ දැන ගත් දා සිටම අම්මා ඔහුට තදින් සිටින්නට වූවාය. කේන්ති ගිය සමහර අවස්ථාවල ඇය ඔහුට කීවේ, , උඹට තවම ගෝත්‍රික නායකකම හම්බවෙලා නෑනෙ. උඹ එක දන්නවනෙ හොඳටම.....,

එක් සවසක ඔහුට සම්පූර්ණ දිනක නිවාඩුවක් අවශ්‍ය විය. ඒ ඔහු සාමාන්‍යයෙන් ගන්නා වරුවක නිවාඩුවක් වෙනුවටය. ඒ පසුදින ඉරිදා නිවසට ගොස් ආපසු ඒමටය.

මම ඔහු යන දිසාව බලා සිටියෙමි. ඉන්පසු ඊළඟ දවසේ මම ඒ දිසාව ඔස්සේ ඔවුන්ගේ ගම බලා ගමන් ආරම්භ කළෙමි.

නිසරු වණ ලැහැබක් පසු කර අඩ හෝරාවකට පමණ පසු මා පිවිසියේ හරිතවර්ණයෙන් යුතු ඉතා මනහර මිටියාවතකටය. ඒ මැදින් සිලි සිලි ගාමින් ජලය ගලා බසින කුඩා ඔයකි. ජලජ පක්ෂීහු නිස්කාංසුවේ ඒ මත දිය කෙලිමින් සිටියහ. වසු පැටියන්ම සඳහා මෙන් ලා තණකොළ මෘදුව ඝනව වැඩී තිබුනි. මේ කෙතරම් සිත නලවන දසුනක්ද? ඇත්තටම පරිසරය හරිම නැවුම් නිසසල එකක් විය. උනුසුම් උදෑසන පරෙවියෝ දිය උගුර යටින් කෑ ගසමින් කහපාට සෙවනැලි වැටෙන තණ බිමේ රැස් කකා සිටියහ. මා හැර වෙනත් මිනිස් පුළුටක් නොවීය.මට දැනෙන නුහුරු නුපුරුදු ආගන්තුකමය හැඟීම මැඩලා ගනිමින් මම ඉදිරියටම ඇදුනෙමි. ස්වල්ප වේලාවකින් කටුමැටි ගැසූ පැල්පත් සමූහයක් මතුවී ගෙන ආවේය. කැලෑ කපා එළි කර ගන්නා ලද ප්‍රදේශයේ සරු සාර ඉරිඟු මිලටි හා වට්ටක්කා වගාවක් විය. තැන් තැන් වල දිගේලි කරන ලදගවයෝ තණ කමින් සිටියහ. බල්ලෝ ඒ අසල නිදා ගෙන උන්හ.

පැල්පත් අසලට ලං වන විට මා දුටුවේ ඒවා ඉතා අලංකාර ලෙස විවිධ කැටයම් යොදා වර්ණවත් කර තිබෙන බවය. කහපාට හෝ රතුපාට ගල්වා ඇති වරිච්චි මැටි වලින් බේරුනු වරිච්චි කෝටු ඉතා උදුරා ගස්වල පට්ටවලින් අපූරු ලෙස ගැට ගසා තිබුනි.

ඊළඟට කළයුත්තේ කුමක්දැයි තේරුම් ගත නුහුණු මම කුඩා කොළුවකුට කථා කළෙමි. ඔහු ඉවත දැමූ කුමක් හෝ ගෙඩියක් වැනි දෙයක් සමඟ සෙල්ලම් කරමින් සිටි අතර බෙල්ලේ එල්ලා ගෙන තිබූ සතුන්ගේ නිය රැඳුනු මාලය ඇරුනු විට සිටියේ සම්පූර්ණ නිරුවතිනි. , මට ඕගොල්ලන්ගෙ නායකයා හම්බ වෙන්න ඕනි, .මම වගක් නැතිව කිවෙමි. කොල්ලා සිය දඹරැඟිල්ල සිය මුවෙහි ඔබා ගෙන ලැජ්ජාවෙන් මා දෙස බලා සිටියේය. විනාඩි කිහිපයක් ඇතුලත මා සිටි පරිසරය හරියට අතහැර දැමූ ගමක් අද්දර ස්වරූපය ඉසිලීය. අවසාන ළමයාද මා ගැවසුනු හරිය අත්හැර සෙස්සන් දිවූ අතට දිව යන්නට විය.

කළයුත්තේ කුමක්දැයි නොදත් මම ඔවුන් හා වරිච්චි ගෙවල් සමූහයද පසුකරමින් හාත්පස එළි කරන ලද බිම් කඩකට පැමිනියෙමි. විශාල තුරු සෙවණක් යට මිනිසුන් දහදොලොස් පොලක් කකුලක් පිට කකුලක් පිට දමා ගෙන බිම වාඩිගෙන සිටියහ. මිස්ලන්ගා ඔවුන් මැදි කරගෙන ගහකට පිටදී ඔහු අත තිබූ කොමඩු ගෙඩියක් වැනි යමකින් යුෂ උරමින් සාකච්ජාවක නිරතවෙමින් සිටින බව පෙනෙන්නට තිබුනි.

මා දුටු විට අඩු තරමින් ඔහුගේ එක් මස් පිඩුවක් වත් සෙලවුනේ නැත. මා දැක සතුටට පත්වූ බවක් ද ඔහුගෙන් පළ නොවීය. සමහර විට මා තුල වූ ලැජ්ජාව නිසා ඔහු පසුබෑවා වන්නටද පුළුවන. මේ නිසා මේ අවස්ථාවට උචිත ආචාරශීලි බව යොදාගැනීමට නුපුළුවන් වුනා විය හැකිය. ?

., චූටි කුමාරිහාමි ගෙදර ඉඳල හුඟක් ඈතට ඇවිල්ල වගේ.....,.මිස්ලන්ගා ප්‍රධානියා අවසානයේදී කීවේය.

, ඔව් .....,මම කීවෙමි.

ඉන්පසු ඇතිව ය් ඉතා දිගු නිහැඬියාවකි. මා එතැනට අදාල නොවන ආගන්තුක එකියක බව පසක් වීමට එතරම් කාලයක් ගත නොවීය. පිරිමින් තුල වූ හිස් නොසැලකිලිමත් බැල්මත් ගැහැණුන්ගේ විමසුම් සහගත ඇස්වලින් කෙරුණු සංවාදයත් මට එහි තවදුරටත් රැඳී සිටීමේ ආසාව නසා දැම්මේය.

මට එතරම් ගරු සරු බවක් නොදැක්වූ ගමෙන් පිටවී හෙමිහිට නිවසට ගෑටුයෙමි. මගේ හදවත හිස්වූ එකක් විය.

මිස්ලන්ගා මම නැවත දුටුවේ තව එක් වරක් පමණි.

එක් රාත්‍රියක තාත්තාගේ ගොවිපලේ එක් හරියක වගාවක් එළු රංචුවක් විසින් විනාශ කර තිබුනි. එය මිසලන්ගාගේ ගමේ එළුවන්ගේ වැඩක් බව පසුව හෙලිවිය.

තාත්තා එසේ පැමිණි සියළු එළුවන් තම සන්තකයට පවරා ගෙන ඔවුන් නැවත ලබා ගන්නට නම් වගා පාඩුවට සරිලන වන්දි ගෙවන ලෙස දන්වා මිස්ලන්ගා වරයා ට පනිවිඩයක් යවන ලදි.

හිරු බැස ගිය එක් සන්ධ්‍යාවක ඔහු අපේ නිවසට පැමිනියේය. අර බිලැන්කැට්ටුව දෙවුරයේ දවටා ගෙන සිටි ඔහු පෙරටත් වඩා මහළුව සිටින බව මට පෙනුනි. තරුණයන් දෙදෙනෙකුට වාරුවී සිටි ඔහු සැරමිටියක් ඇන ඇන ඇවිද ගෙන ආවේ මහත් වෑයමිනි.. අත් හෝ පා නැමීම බෙහෙවින් දුෂ්කර විය. තාත්තා ඔහු සතු විශාල සනීප පුටුවේ වාඩි ගත් අතර මහල්ලා බොහෝ පරිස්සමින් තරුණයන්ගේ උදව්වෙන් ඔහු ඉදිරියේ වාඩි ගත්තේය.

දෙදෙනා අතර සංවාදය හෝ වාදය බෙහෙවින් දිගු හා වෙහෙසකර එකක් විය. එක් හේතුවක් වූයේ, ඔහු කැටුව ආ තරුණයින් දෙදෙනාගේ දුර්වල ඉංග්‍රීසි දැනුම භාෂා පරිවර්ථනයේ දි බාධාවක් වීමය. අනෙක , තාත්තාට ඔවුන්ගේ භාෂාව කථා කිරීමට නොහැකි කමය.

තාත්තාගේ මතය වූයේ , සිය වගාවට අඩුම ගානේ පවුම් දෙසියක වත් අලාභයක් සිදුවී ඇති බවය. මහල්ලාගෙන් ඒ මුදල අය කර ගත හැකි බව ඔහු දැන සිටියේය. ඊට අමතරව එළුවන් තමා සන්තකට ගැනීමට අයිතියක් ඇති බවද ඔහුගේ මතය විය. එහෙත් මිසලන්ගා වරයා ඉමහත් කෝපයෙන් ඊට එරෙහි විය. ,මගේ මිනිස්සු කොහොමද එළුවො විස්සක් නැති කරගන්නෙ? අපි පොහොසත් මිනිස්සු නෙවෙයි ඔහේ වගේ........, තාත්තා කිසිවිටික තමන් පොහොසතකු ලෙස නොසැලකුවේය. ඒ වෙනුවට තමන් දුප්පත් යැයි හැම විටම කියා සිටින්නෙකි. ඉතින් ඔහු කෝපයෙන් හා ඉතා ඉක්මණින් උත්තර දෙයි. එළුවන් සිය ගොවිපලට කරන හානිය කිසිවිටක සුළු කොට නොතකන බව ඔහු කියා සිටියේය. මේ එළුවන් සතු කර ගැනීමට සම්පූර්ණ අයිතිය තමන් සතු බව ඔහු නැවතත් තරයේ කියා සිටියේය.

වාදය කෙතරම් උනුසුම් වූයේද යත් - අන්තිමට කුස්සියේ වැඩ කළ ඔහුගේ පුත්‍රයාද පරිවර්ථකයා වශයෙන් එහි කැඳවන ලදි. ඉන්පසුව තාත්තා වඩාත් ව්‍යක්තව හා ඉක්මණින් ඉංග්‍රීසියෙන් කථා කරන්නට පටන් ගත් අතර කෝකියා ඒවා ඉක්මණින්ම සිය පියා වන මහල්ලාට ඔහුගේ බසට පෙරලා දෙන්නට විය. ඒ මගින් මේ සිද්ධිය නිසා තමන් කෙතරම් කෝපයෙන් සිටින්නේද යන වග මහල්ලා තේරුම් ගනු ඇතැයි තාත්තා සිතුවේය. එහෙත් මගේ තාත්තා දැරූ අදහස් වලින් භාවාතිශය නොවූ තරුණයා ඒ අදහස් පෙරලුවේ යාන්ත්‍රිකමය ස්වරයකිනි. ඇස් බිමට යොමා ගෙන සිය කාර්යය ඉටු කළද, තම පිලට එරෙහිව යන ක්‍රියාවලියේ බර තම උරහිස මතත් පැටවීම පිළිබඳ මනා අවබෝධයක් ඔහු තුල වූ බව පෙනුනි.

හිරු අවරගිරින් ගිලී යාමට ආසන්නය. එහි විවිධ වර්ණාවලීන් ගිලිහි ගොසිනි. කුරුල්ලෝ සිය අවසාන ගීත ගායනා කරති. ගවයෝ සාමකාමීව හඬ තලමින් ගාල් කරා ඇදෙති. මෙය අප්‍රිකාවේ ලස්සනම හෝරාවයි. එහෙත් අප නිවසේ ගතවන්නේ වඩාත් අමිහිරි අවලස්සන සිද්ධියකි. මෙයින් කිසිදු පාර්ශවයකට සෙතක් අයත් නොවේ. තාත්තා අවසානයේදි කීවේ,, මම තවත් වාද කරන්න යන්නෙ නෑ. එළුවො ටික මම ආපහු දෙන්නෙ නෑ....,.

එවිට මහල්ලා එයට එක්වරම සිය බසින් උත්තර දුන්නේය., මේකෙ තේරුම මගේ මිනිස්සුන්ට පායන කාලෙ බඩගින්නෙ ඉන්න වෙන එකනෙ?...,.

, පලයන් ඉතින් පොලිසියට .....,තාත්තා ජයග්‍රාහි සිනාවක් පාමින් පිළිතුරු දුන්නේය..

තවත් කීමට කිසිවක් ඉතිරිව තිබුනේ නැත.

මහල්ලා නිසසල ව ඉඳගෙන සිටියේය. හිස බිමට නැවී තිබුනි. දෑත් අසරණ ලෙස දෙපසට එල්ලී තිබුනේය. ගෙවී ගිය දණහිස් ඔහුගේ සිරුර නැගිටුවා ගත නුහුණු හෙයින් තරුණයෝ දෙදෙනා ඒ සඳහා වාරු වූහ. සිටගත් ඔහු තාත්තාට මුහුණ දුන්නේය. සිය බසින් ඔහු වේගයෙන් කථා කළේය. ඉන්පසු ඉවත හැරී සිය ගම බලා පිරිස කැටුව පා නගන්නට විය.

,මොකක්ද මිනිහ අන්තිමට ඒ කිව්වෙ? , තාත්තා කේන්තියෙන් ඇසුවේ කෝකියාගෙනි. ඔහු පිළිතුරු වශයෙන් අපහසුවෙන් සිනාසුනා මිස කිසිත් කීවේ නැත.

,මොකක්ද උඹේ තාත්ත කිව්වෙ?...., අපේ තාත්තා ගේ හඬ තවත් වේගවත් විය.

කෝකියා සිය හිස කෙලින් කර ගෙන නිසල විය. ,මගේ තාත්ත කිව්වෙ, තමන්ගෙ ඉඩම කියල ඔහේ කියන මේ ඉඩම ..මේ මුළු ඉඩමම අයිති එයාගෙ මිනිස්සුන්ට ලු. මේව ඒ අයගෙන් බලෙන් උදුර ගත්ත ඒවලු.

එසේ කී ඔහු කුස්සියෙන් පිටවී පියා ගිය දෙසටම යන්නට ගියේය. අපි ඔහු නැවත දුටුවේ නැත.

ඊළඟ වාරයේ අර පොලිස් නිළධාරියා පැමිණ මෙසේ කීවේය.,. අර මිස්ලන්ගෙ ගම මේ හරියෙන් අයින් කරන්න තීරණය කරල තිබුනෙ හුඟ කල් ඉඳල. මට තේරෙන්නෙ නෑ ඒක මෙච්චර කලක් ක්‍රියාත්මක වුනේ නැත්තෙ කියල. මම ලබන ඉරිද ස්වදේශ කටයුතු භාර කොමසාරිස් හම්බ වුනා මේ ගැන සොයල බලන්නං...,

■

16 වන පිටෙන්

"නවරත්න අයියා මට නිදහස දුන්නා මට ඕන විධියට කරන්න කියලා. සශිකා කුඩා දැරියකසේ සිනාසුනාය. තවමත් දෙමව්පිය රැ කවරණ මැද සියළු කටයුතු කරගෙන යන ඇය සැබැවින්ම දැරියක් නොවෙයිද? මෑතකදී ඇය කැළණිය සරසවියේ ලලිත කලාවේදී විශේෂ උපාධිය සම්පූර්ණ කළාය. ජාතික තරුණ සේවා සභාව දියත් කළ ගායනා තරඟාවලියකින් දිවයිනේ ප්‍රථම ස්ථානය දිනා ගනිමින් ඇයගේ ගමන් මඟ ඇරඹුනේත් මවු ගුණ ගීයකින්.

අවිස්සාවේල්ලේ සංගීතාචාර්යවරයෙකු වන විශාරද ආනන්ද රාජපක්ෂ මහත්මාගෙන් සංගීතය හැදෑරීම ඇරඹූ සශිකා පසු කලෙක නුගේගොඩ අනුලා විද්‍යාලයේදී සංගීතය හදාලේ ප්‍රවීන ගායිකා විශාරද දීපිකා ප්‍රියදර්ශණී ගුරුවරිය වෙතින්.දැනට විශාරද පළමුවන කොටස ගායනා අංශයෙන් සම්පූර්ණ කර, දෙවන කොටස සඳහා විශාරද ශාස්ත්‍රපති රශ්මි සංගීතා ගුරුවරිය යටතේ ගායනාවද , සංගීතාචාර්ය සෝමසිරි ඉලේසිංහ මහත්මා යටතේ වයලින වාදනයද හදාරන ඇය බටහිර සංගීතයද හැදෑරීමට බලාපොරොත්තුවෙනවා.

සිංහල අවුරුදු දා හිමිදිරියේම කැවුම් කිරිබතින් සංග්‍රහකොට පිළි අරගෙන සන්නස වෙනුවෙන් සශිකා හා දොඩමළුවන්නට ඉඩ සලස්වාදුන් බෙරික් හි පදිංචි උඩුවෙල ගුණවර්ධන මහත්මාටත් එම මැතිණියටත් පාඨක සැම වෙනුවෙන් ස්තුතිය පිරිනමමින් පිළිසඳර නිමා කළා.

■

